# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2109/9 – 2019 පෙබරවාරි 05 වැනි අඟහරුවාද – 2019.02.05

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම්, පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, ඒවා ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උපවගන්තිය යටතේ, ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය ගයන්ත කරුණාතිලක වන මම, මෙයින් ප්‍රකාශ කරමි.

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, පිටබැද්දර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මොරවක් කෝරළය සුළු කොට්ඨාසයේ, පිටබැද්දර (අ.ග.පි.6) ගමේ පිහිටි මැනුම්පති විසින් පිළියෙළ කරන ලද අංක එම්ආර්/පීටීබී/2017/668 හා 2018.04.26 දිනැති ප්‍රගමන අනුරේඛනයේ කැබලි අක්ෂර ඒ සහ බී වශයෙන් පෙන්නුම් කර ඇති ප්‍රමාණයෙන් හෙක්. 2.1013ක් පමණ වූ පහත සඳහන් මායිම් තුළ පිහිටි ඉඩම් කොටස්:

01. **කැබලි අක්ෂර 'ඒ' – තැන්නහේන වත්ත ඉඩම – ප්‍රමාණය: හෙක් 0.6858ක් පමණ**

උතුරට: ඇළ; නැගෙනහිරට සහ දකුණට: මාර්ගය; බටහිරට: නමුණුකුල වතු සමාගම හිමිකම් කියන තැන්නහේන වත්ත.

02. **කැබලි අක්ෂර 'බී' – තැන්නහේන වත්ත ඉඩම – ප්‍රමාණය: හෙක් 1.4155ක් පමණ**

උතුරට: මාර්ගය, එම්. රාජේන්ද්‍ර හිමිකම් කියන තැන්නහේන සහ නමුණුකුල වතු සමාගම හිමිකම් කියන තැන්නහේන වත්ත; නැගෙනහිරට: කෝරළේහේවගේ ධර්මදාස සහ තවත් අය හිමිකම් කියන තැන්නහේන; දකුණට: කෝරළේහේවගේ ධර්මදාස සහ තවත් අය හිමිකම් කියන තැන්නහේන සහ නමුණුකුල වතු සමාගම හිමිකම් කියන තැන්නහේන වත්ත: බටහිරට: නමුණුකුල වතු සමාගම හිමිකම් කියන තැන්නහේන වත්ත සහ මාර්ගය.

ගයන්ත කරුණාතිලක,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය.

මගේ අංකය - 4-3/15/2017/වීඊ/468.
2019 ජනවාරි මස 03 වැනි දින,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය,
'මිහිකත මැදුර',
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

02 - 658


1A – G29407 – 16(2019/02) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*